# ඔල්ගාගේ සිහිනය



ඔනාදී තිසාමා නවරත්න

# ඕල්ගා ගේ සිහිනය

ඔනාදී තිසාමා නවරත්න

# ඔල්ගා ගේ සිහිනය

ඔනාදී තිසාමා නවරත්න

99B/2 උඩ ඊරියගම, පේරාදෙණිය.

**චිත්‍ර**

ඔනාදී තිසාමා නවරත්න

**ISBN 978-624-206-665-3**

**කතෘගේ වෙනත් කෘති**

- ලොකුම වැරැද්ද
- ඔලීනාට  තැග්ගක්
- අපූරු  ගමන
- Mother Earth smiled at Olumalee
- Enchanted Present
- Little Olga's dream

**ප්‍රකාශක** - මහමායා බාලිකා විද්‍යාලය.- මහනුවර

**කෘතිය එළිදක්වන දිනය**   2023-11-15

# පිදුම

සෑම වැඩක දී ම

මට උදව් කරන

මගේ ආදර අම්රු අයියාට

මෙම පොත

පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023. 11 . 01

එකමත් එක කාලෙක පුංචි ගැහැණු ළමයෙක් හිටියා එයාගේ නම ඕල්ගා. ඕල්ගාට වයස අවුරුදු දහය යි.

ඇය මව, පියා, සහෝදරයා සහ ඇගේ ආච්චි අම්මා සමග ජීවත් වුණා.

ඕල්ගාගේ නිවස පිහිටියේ සුන්දර ගමක යි. කඳුකරයේ සිට ගම්මානයට එන සිසිල් සුළං ඕල්ගාගේ නිවසේ හැමතැන ම ගලා ගියා.

ඕල්ගාගේ තාත්තා එළවළු හා පලතුරු වර්ග වගා කරනවා.

ස්වභාව ධර්මයේ සුන්දරත්වය හොඳින් ම තිබුනත් පුංචි ඔල්ගා ගමට කැමති වූනේ නැහැ. ඇය නගරයට ආසා කළා.

නගරයට ගොස් විනෝද වීමටත් නොයෙකුත් රස කෑම කෑමටත් ඇයට උවමනා වුණා.



දවසක් රෑ අහසේ තරු රටා බලමින් සිටි ඕල්ගාට ලොකු නිදි මතක් දැණුනා.

එදා ඇය සිහිනෙන් තරු අතරට ගියා. ඕල්ගාව වටකරගෙන තරු නටන්න පටන් ගත්තා.

රතු තරුවක් බැබළෙමින් ඕල්ගා ළඟට ඇවිත් මෙහෙම ඇහුවා.

"පුංචි ඕල්ගා ඔයා වැඩියෙන් ම කැමති කුමකට ද?" ඉතින් මෙහෙම අහන කොට ඕල්ගාට එයා ආසම දේ මතක් උණා.

"අනේ....! මම නගරයට යන්න ගොඩක් කැමතියි" ඕල්ගා කිව්වා.

"එන්න අපි යමු" රතු, නිල්, කහ තරු ඕල්ගාට කිව්වා.



නගරෙට ගිය ඔල්ගා අවන්හලකින් පලතුරු රස ටොෆියක් රැගෙන රස බැලුවා.

“ම්...ම්... හරිම රසයි” ඇය තවත් එකක් ගත්තා.

“ම්...ම්.. ඒත් ගමේ නැවුම් පලතුරු වල රස නැනේ” කියූ ඔල්ගාට ගමේ තිබෙන සාමකාමී නිදහස් පරිසරයක් නගරයේ නැති බව දැණුනා.


CANDY

ඉතින් ඇය පාර දිගේ ඉදිරියට ගියා. වාහනවල ශබ්දය නිසා කන්වලට ලොකු මහන්සියක් ඇයට දැණුනා.

නැවුම් වාතය ආශ්වාස කිරීමට ගමට දිව යාමට ඇයට සිතුණා.


Pizza

“පුංචි ඔල්ගා එන්න අපි යමු” ඒත් එක්ක ම රතු තරුව බැබළෙමින් කිව්වා.

“නැගිටින්න..... ඔල්ගා...ඔල්ගා, මගේ දුවේ... ඔන්න ඉර ලස්සනට පායලා” ආච්චි අම්මා ඔල්ගා ළඟ හිඳ ඇයව නින්දෙන් ඇහැරෙව්වා.

ඉතිං තමා සිහිනෙන් නගරයට ගිය බව ඔල්ගාට තේරුණා.



නැගිටින්න ඔල්ගා

තමා ජීවත් වන ගම ඉතා ප්‍රීතිමත් බව ඇය තේරුම් ගත්තා.

ඇ තම සිහිනය මව, පියා, සහෝදරයා හා ආච්චි අම්මා සමග කිව්වා.

එදා සිට ඔල්ගා තමන්ගේ පවුලට, සතුන්ට හා සොබාදහමට වෙනදාටත් වැඩියෙන් ආදරය කරන්න පටන් ගත්තා.

නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023 . 11 . 01**